# සිංහලේ මුල්ම නිදහස පතා සටන්කළ
# වීර කැප්පෙටිපොළ

ජේ. මු. ඉ. කරුණාරත්න හේරත්

"මහත්මයාණෙනි, මා යුතුකම් පැහැර හරින්නෙකු ලෙස නොසිතන්න. ඔබගේ තුවක්කුත්, වෙඩිබෙහෙතුත් ඔබගේම මිනිසුන් මරන්නට යෙදවීම මගේ සිංහලකමට බාධකමකි. එබැවින් කරුණාකර මේ සියල්ල ආපසු බාර ගන්න."

ඉහත දැක්වූයේ කැප්පෙටිපොළ නිලමේතුමා විසින් සර් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාර වරයා වෙත යවන ලද ලිපියක කොටසකි. ඉංග්‍රීසි ආණ්ඩුව යටතේ ඌව වෙල්ලස්සේ මහදිසාව වශයෙන් පත්කොට සිටි කැප්පෙටිපොළ නිලමේතුමාට මෙම ලිපිය ආණ්ඩුකාර වරයාට යැවීමට සිදුවූයේ 1818 ඌවවෙල්ලස්ස මහා කැරැල්ලට සම්බන්ධ වී කැරැල්ල සිදුවන අතරමග සිටයි.

කැප්පෙටිපොළ නිලමේතුමා ලියූ ඉහත වැකිය මා මුලින්ම සඳහන් කිරීමට කල්පනා කළේ එතුමා තුළ පැවති සාධාරණත්වය, යුක්තිගරුක බව, සත්‍යකම, වීරත්වය, සිංහලකම මොනවට එතුමාගේ වචනවලින් ම පැහැදිලි වන නිසයි.

කැප්පෙටිපොළ නිලමේතුමා ගැන 1818 ඌවේ කැරැල්ල පිළිබඳව අනිවාර්යයෙන්ම විමසා බැලිය යුතු වේ. 1818 කැරැල්ලට හේතු වූ කරුණු පළමුව සොයා බැලීම අපගේ යුතුකමක් මෙන් ම වගකීමක් ද වේ.

නායක්කාර් වංශික ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ දුර්දාන්ත රාජ්‍ය පාලනය මෙයට හේතු වූ නිධාන කථාව වශයෙන් දක්විය හැකිය. ශ්‍රී වික්‍රම රාජසිංහ වඩුග රජු දශරාජ ධර්මයටම පිටුපා කටයුතු කළ රජකු වූවා පමණක්